# <u>අවබෝධතා ගිවිසුම</u>

සමාජ සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීමත් සමඟම එම යෝජනා කුමය යටතේ හඳුනාගත් ප්‍රතිලාභී පවුල් අතරින් දුප්පත් හා අන්ත දුප්පත් යන කාණ්ඩ දෙකට අයත් පවුල් මිලියන 1.2 වසර 3ක් තුල පූර්ණ වශයෙන් සවිබල ගැන්වීමේ වගකීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. ඒඅනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ජාතික මට්ටමින් 2024 වර්ෂයේ පවුල් ලක්ෂ 3ක් සවිබල ගැන්වීමේ වැඩසටහන සැලසුම් කර ක්‍රියාවට නංවා ඇත.

ඒ යටතේ ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය නමින් ආසියානු සංවර්ධන බැංකුවේ මුල්‍ය සහාය ඇතිව ලංකාවේදිස්ත්‍රික්ක13ක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 64කග්‍රාමනිලධාරීවසම්400ක් තුළ දැඩිදිළිඳුසහදිළිඳුඅස්වැසුමප්‍රතිලාභීන්12800ක්ඉලක්ක කර සවිබල ගැන්වීමේ වැඩසටහනක් මාස24ක්පුරාක්‍රියාත්මකකෙරේ.

එම වැඩසටහන යටතේ හඳුනාගන්නා නිවාසඒකක පරිපූර්ණ, කාලානුරූපීසහක්‍රමානුකූල ප්‍රවේශයක්ඔස්සේසමාජආර්ථිකසවිබලගැන්වීමේසහඔරොත්තුදීමේහැකියාවගොඩනගා දිළිඳුකමින්මුදවාගෙනතිරසාරජීවනෝපායන්වෙතඔසවාතැබීමටකටයුතුකෙරේ. ඒ සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන අදාලව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා තෝරාගනු ලබන ප්‍රතිලාභියා අතර එක් එක් පාර්ශවයන්ගේ යුතුකම් හා වගකීම් පිළිබඳව අනයෝන්‍ය වශයෙන් අවබෝධ කර ගැනීමේ ගිවිසුම.

මෙහි පළමු පාර්ශවය යැයි කියනු ලබන ළමා, කාන්තා කටයුතු හා සමාජ සවිබල ගරන්වීම් අමාත්‍යාංශයට 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් ------------------ දිස්ත්‍රික්කයේ ----------------- ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ අංක --------------------------------------- ග්‍රාමනිළධාරි වසම වෙනුවෙන් ( ප්‍රාදේශිය ලේකම් වරයා විසින් බලය පවරන නිළධාරියා) පළමු පාර්ශවය ලෙස ද

---------------------------------------------- ස්ථිර ලිපිනයේ පදිංචි ඉතා දිළිඳු/ දිළිඳු අස්වැසුම ලාභියෙකු වන මෙහි මින්මතු ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා විධිමත් පරිදි තෝරාගත් ( අස්වැසුම ප්‍රතිලාභි අංකය )-------------------------දරණ --------------------------------------------------- ( සම්පූර්ණ නම ) මයා/මිය යන අය දෙවන පාර්ශවය ලෙස බැදි දෙපාර්ශවයේ එකඟතාවය ඇතිව වර්ෂ ----------------- ක් වූ ----------------- මස -------------- වෙනි දින ඇති කර ගන්නා ලද ගිවිසුමයි.

1. පළමු පාර්ශවයේ වගකීම
    1. ව්‍යපෘතියේ ක්‍රියාකාරිත්වය අදාල තොරතුරු ප්‍රජාව දක්වා ලබාදීම
    2. ව්‍යාපෘතියේ සාර්ථකත්වය සඳහා ප්‍රජාව ඉලක්ක කර ලබාදීය යුතු පුහුණු වැඩමුළු නිවැරැදි වේලාවට ලබාදීම
    3. ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සහාය ආයතන සම්බන්ධිකරණය
    4. සමෘද්ධි කළමනාකරුවන්ට හා සමෘද්ධි සංවර්ධන නිළධාරින්ට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබාදීම
    5. ජීවනෝපාය ව්‍යාපෘති හා වැටුප් රැකියා මාර්ග සඳහා නිසි වේලාවට ප්‍රාග්ධනය ලබාදීම
    6. ව්‍යාපෘති ක්‍රියාකාරිත්වය පිළිබඳ පසුවිපරම හා ප්‍රගති පාලනය

**I. දෙවන පාර්ශවයේ වගකීම්**

1. වැඩසටහනේ ක්‍රියාකාරී සහභාගිවන්නෙකු බවට පත්වූ පසු ඒ සඳහා කැපවී ක්‍රියාකිරීම, සහ වැඩසටහන නිල වශයෙන් අවසන් වන තෙක්, පුහුණුවීම්, පුහුණු කිරීම් සහ උපදේශන සැසි, ජීවනෝපාය ක්‍රියාකාරකම් සහ රැස්වීම් වැනි සියලුම ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීම.

INTERNAL. This information is accessible to ADB Management and staff. It may be shared outside ADB with appropriate permission.

2. වැඩසටහන් ක්‍රියාකාරකම්, පුහුණු සැසි සහ අධීක්ෂණ චාරිකා අතරතුර සියලුම වැඩසටහන් නිළධාරීන් සමඟ පූර්ණ සහ අඛණ්ඩව සහයෝගයෙන් කටයුතු කිරීම සහ ඉල්ලා සිටින අවස්ථාවන්හී දී සත්‍ය තොරතුරු බෙදා ගැනීම.

3. වැඩසටහන මගින් සහය දක්වන ජීවනෝපායක්‍රියාවට නංවන අතරතුර මුහුණ දෙන අභියෝග හෝ ගෘහාශ්‍රිතව මුහුණ දෙන අභියෝග ඇතුළුව නිවැරදිසහ සත්‍ය තොරතුරු අධීක්ෂණය සඳහා පැමිණෙනනිලධාරීන් වෙත සැපයීම.

4. වැඩසටහන මගින් හඳුන්වා දුන් ග්‍රාමීය ඉතුරුම් සහ ණය සමිතිය (ග්‍රා.ඉ.ණ.ස)සාමාජිකයෙකු වීමසහසාමාජිකයින් විසින් සකසා ඇති ග්‍රා.ඉ.ණ.සව්‍යවස්ථාවට අනුකූලව, වැඩසටහන නිල වශයෙන් අවසන් වන තෙක් එහි සියලුම රැස්වීම්වලට නිතිපතා සහ අඛණ්ඩව සහභාගී වීම.

5. ග්‍රා.ඉ.ණ.ස පිළිබඳ පුහුණුව, මූල්‍ය සාක්ෂරතා පුහුණුව, ජීවන කුසලතා පුහුණුව, ව්‍යාපාර කුසලතා පුහුණුව සහ තාක්ෂණික පුහුණුව (ව්‍යවසායකත්ව) සහ නිපුණතා පුහුණුව (රැකියා මාර්ග) ඇතුළුව මෙම වැඩසටහන මඟින් සපයනු ලබන සියලුම පුහුණුවීම් වෙත පැමිණීම සහ ඒ සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.

6. විවිධ පුහුණුවීම්, පුහුණු සැසි සහ වැඩසටහන් ක්‍රියාකාරකම් වලදී ලබා දෙන දැනුම, කුසලතා සහ මඟපෙන්වීම පවුලේ සාමාජිකයන් සමඟ බෙදාහදා ගනිමින් එය එදිනෙදා ජීවිතයට ඇතුළත් කිරීම.

7. මෙම ප්‍රතිලාභී නිවස සඳහා සුදුසු ජීවනෝපායක් හඳුනා ගැනීම පිණිස ජීවනෝපාය ගැලපීමේ උපදේශන ක්‍රියාවලියේ සක්‍රීයව නිරත වීම.

8. ජීවනෝපායක් ආරම්භ කිරීමට හෝ දැනට පවතින ජීවනෝපායවැඩිදියුණුකිරීමට අවශ්‍ය අයිතම, පිරිවැය ඇස්තමේන්තු සහ මිල ගණන් ඇතුළුව, නිවැරදි තොරතුරු සහිත ජීවනෝපාය සැලැස්මක්සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයාගේ මඟපෙන්වීම සහිතව සකස් කිරීම.

9. වැඩසටහන යටතේ වඩාත් ගැළපෙන බවට හඳුනාගත් ජීවනෝපාය ක්‍රියාත්මක කිරීමට, පවත්වා ගෙන යාමට සහ වැඩිදියුණු කිරීම පිණිස සුදුසුම දේ කළ යුතු අතර එවිට එතුළින් ස්ථාවර සහ විශ්වාසනීය ආදායමක් උපයා ගැනීමට හැකි වනු ඇත.

10. ජීවනෝපාය සැලැස්මේ විස්තර කර අනුමත කර ඇති පරිදි, එම අරමුණ සඳහා පමණක් ජීවනෝපාය ආධාර දීමනාව භාවිතා කිරීම.

11. ජීවනෝපාය ආධාර ප්‍රදානය කිසිම හේතුවක් මත සහ වෙනත් කිසිම කටයුත්තක් සඳහා අවභාවිතා නොකිරීම.

12. ජීවනෝපාය සැලැස්ම ක්‍රියාවට නැංවීම පිණිස අනුමත ජීවනෝපාය ආධාර ප්‍රදානයට වඩා වැඩි මුදලක් අවශ්‍ය වන්නේ නම්, තෝරාගත් ජීවනෝපාය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අමතර මුදලතමා විසින් දායක කිරීම.

13. ජීවනෝපාය ආධාර ප්‍රදානය භාවිතා කර මිලදී ගන්නා ඕනෑම භාණ්ඩයක්, තෝරාගත් ජීවනෝපාය සඳහා පමණක් භාවිතා කිරීම, එය නිසි ලෙස නඩත්තු කිරීම, අනිසි ලෙස භාවිතා නොකිරීම හෝ නීති විරෝධී ක්‍රියාවක නොයෙදවීම.

INTERNAL. This information is accessible to ADB Management and staff. It may be shared outside ADB with appropriate permission.

14. ජීවනෝපාය ආධාර ප්‍රදානය උපයෝගී කර ගනිමින් වැඩසටහන මඟින් සපයනු ලබන කිසියම් ද්‍රව්‍යයකට/වත්කමකට (උදා: අමුද්‍රව්‍ය, යෙදවුම්, උපකරණ, මෙවලම් ආදිය) සොරකම් කිරීම, අලාභ හෝ හානි සිදුකිරීම වැනි යමක් සිදු වුවහොත්, ඒ බවප්‍රාදේශීය කළමනාකරු වෙත වාර්තා කිරීමඋදෙසාසමෘද්ධි සංවර්ධන නිලධාරී වෙත වාර්තා කිරීම.

15. මෙම වැඩසටහන යටතේ, හිමිවන සියලු උපකාර, ගෘහස්ථ ආර්ථික හා සමාජීය වැඩිදියුණුව පිණිස ඉතිරිකිරීම් වැඩි කිරීමට සහ ජීවනෝපාය සඳහා නැවත ආයෝජනය කිරීමට ප්‍රවේශමෙන් හා උනන්දුවෙන් යෙදවීම.

## V. පාර්ශවදෙක සඳහාමබලපැවැත්වෙනඅනෙකුත්කොන්දේසි:

1. මෙමඅවබෝධතාගිවිසුමේසපයානොමැතිකරුණක්සම්බන්ධව කුමනආකාරයකහෝගැටළුවක්ඇතිවුවහොත් එකී ගැටලුව ඔවුනොවුන්අතරඅන්‍යෝන්‍යඑකඟතාවයසහකැමැත්ත මතවිසඳාගතයුතුබවටපාර්ශවයන්මෙයින්එකඟවේ.
2. අත්සන් කරන ලද සියලුම පාර්ශ්වයන් විසින් අන්‍යෝන්‍යවශයෙන් ඇති කරගනු ලබන ලිඛිත ගිවිසුමකට යටත්ව අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීම සහ/හෝඑයට නව විධිවිධානයක් අතිරේක වශයෙන් එකතු කිරීමට කටයුතු කළහැක.

මිට සාක්ෂි වශයෙන් පළමු පාර්ශවය වෙනුවෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට ------------------ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ---------------------- ග්‍රාම නිළධාරි ප්‍රාදේශිය විසින් බලය පවරන නිළධාරියා හා දෙවන පාර්ශවය වෙනුවෙන් මතු නම හා ලිපිනය සඳහනේ ව්‍යාපෘති මිහිකරු වර්ෂ ----------- ක් වූ ----------------- මස --------------------- වැනි දින --------------------------------- හිදි අත්සන් තබන ලදි.

| පළමුපාර්ශවය | දෙවනපාර්ශවය |
|---|---|
| අත්සන:- ------------------ | අත්සන:-…………………….. |
| ( ප්‍රාදේශීය විසින්බලයපවරනනිළධාරියා ) | ව්‍යාපෘති හිමිකරු:- …………… |
| අධ්‍යක්ෂ ජනරාල්වෙනුවට | ජාතිකහැඳුනුම්පත්අංකය |
| ( නිලමුද්‍රාව) | (…………………….) |
| දිනය…………… | දිනය …………………. |

| පළමුපාර්ශවය වෙනුවෙන්අත්සනට සාක්ෂි | දෙවන පාර්ශවය වෙනුවෙන්අත්සනට සාක්ෂි |
|---|---|
| 1. නම:- ------------------------------- | 1. නම :- ----------------------------- |
| අත්සන:- --------------------------- | අත්සන:- ------------------------- |
| ජා.හැ. අංකය:- -------------------- | ජා.හැ.අංකය --------------------- |

INTERNAL. This information is accessible to ADB Management and staff. It may be shared outside ADB with appropriate permission.